ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

**ඉල් පුන් පොහෝ දිනය සමරමින් ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය ගම්පහ දිස්ත්‍රික්කයට ළඟා වේ**

කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් 10 වන වරටත් සංවිධානය කරනු ලබන ජංගම බෞද්ධ ප්‍රදර්ශනය 2024 නොවැම්බර් 15 වන දිනට යෙදෙන ඉල් පුන් පොහෝ දිනය නිමිත්තෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල, හැඳල පුරාණ රජමහා විහාරයේදී පැවැත්වේ.

2. ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය දැක්වෙන මෙම ප්‍රදර්ශනයට බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් අවස්ථා හා සබැඳි ස්ථාන සහ මහාරාෂ්ට්‍ර, උත්තර් ප්‍රදේශ්, බිහාර්, ලඩාක්, අන්ද්‍රා ප්‍රදේශ් සහ කාශ්මීර් වැනි විවිධ ස්ථානවල පිහිටා තිබෙන වැදගත් බෞද්ධ සිද්ධස්ථානවල ඡායාරූප ද ඇතුළත් වේ.

3. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන ජංගම ප්‍රදර්ශන මාලාව මෙම වසරේ සෑම පොහොය දිනකදී ම දිවයින පුරා විවිධ බෞද්ධ විහාරස්ථානවල පැවැත්වේ. නවම් පොහොය දිනයේදී කළුතර බෝධියෙන් ඇරඹි ප්‍රදර්ශනය කොළඹ ශ්‍රී සම්බෝධි මහා විහාරය, රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන, මාතලේ ධර්මරාජ පිරිවෙන ඇතුළු වැදගත් බෞද්ධ විහාරස්ථාන රැසක දී පැවැත්විණ. වත්තල ප්‍රදේශයේ පැවති දස වන ප්‍රදර්ශනය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර සබඳතා ශක්තිමත් කරන ප්‍රයත්නය තවදුරටත් ඉදිරියට ගෙන යයි.

4. පැවති සෑම ප්‍රදර්ශනයක් සඳහාම ඉහළ ප්‍රතිචාරයක් හිමි වූ අතර බැතිමත්හු ප්‍රදර්ශනයේ ආධ්‍යාත්මික සහ සංස්කෘතික වැදගත්කම අගය කළහ. මෙම මුලපිරීම දෙරට ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් ගන්නා ඒකාබද්ධ ප්‍රයත්නයන් තවත් සවිමත් කරමින් දෙරට අතර සංස්කෘතික බැඳීම සහ බෙදා හදා ගන්නා උරුමය පිළිබිඹු කරයි.

***

**කොළඹ**

***2024 නොවැම්බර් 15***